IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය
# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
# ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පරීක්ෂණය - 2014/15

**(ප්‍රථම සෙමෙස්තර පරීක්ෂණය)**

**(පවත්වන ලද්දේ 2016 දෙසැම්බර)**

## DY 03 - ආර්ථික විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. i මිනිස් අවශ්‍යතා හා වුවමනාවන්හි වෙනස උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii භාණ්ඩ හා සේවා අතර සමාන හා අසමානකම් උදාහරණ දක්වමින් සඳහන් කරන්න.

(ලකුණු 05)

iii "ආර්ථික නොවන භාන්ඩද විටෙක ආර්ථික භාන්ඩ බවට පත්වේ"
ඉහත ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේද? ඔබගේ පිළිතුර උදාහරණ සමගින් විස්තර කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

02. නිෂ්පාදනය, හුවමාරුව හා පරිභෝජනය අතර පවතින අන්තර් සම්බන්ධතාවය විශ්ලේෂණාත්මකව උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 20)

03. i නිෂ්පාදන සාධකයන් ලෙස ශ්‍රමය හා ව්‍යවසායකත්වයේ පවතින සමාන හා අසමානකම් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii "භූමිය යනු ස්වභාවධර්මයාගෙන් දායාදිත සම්පතකි. එබැවින් එය නිෂ්පාදනය විකාශනයට බාධාවක් වේ" ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 10)

iii නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවයට ප්‍රාග්ධනයෙන් වන බලපෑම විස්තර කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

04\. i නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් යනු කුමක්ද? නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් නිර්මානය කිරීමේදී යොදගන්නා උපකල්පන විස්තර කරන්න.

(ලකුණු 10)

ii " වැඩෙන ආවස්ථික පිරිවැය සහිත නිෂ්පාදන හැකියා මායිමක් මූලයට අවතලව පිහිටයි" කල්පිත සංඛ්‍යා දත්ත යොදා ගනිමින් නි. හැ. මා වක්‍රය නිර්මානය කර ඉහත ප්‍රකාශය සනාථ කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05\. ආර්ථිකය තුල සේවා අංශයේ ව්‍යාප්තිය අනෙකුත් ආර්ථික අංශ වන කෘෂිකාර්මික හා කාර්මික අංශයන්ට සිදුකරන බලපෑම උදාහරණ සමගින් ශ්‍රී ලංකාව ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 20)

06\. i "සමාජවාදී අර්ථ ක්‍රමයක් වර්තමාන ආර්ථික ව්‍යුහයකට වඩා උචිත වේ" ඉහත ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii ධනවාදී අර්ථක්‍රමයේ යහපත් හා අයහපත් ලක්ෂණ දක්වා, මෙම ආර්ථක්‍රමය සාර්ථක වීමට නම් සිදුවිය යුතු වෙනස්කම් යෝජනා කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

07\. පහත සඳහන් සංකල්ප පිලිබඳ කෙටි සටහන් ලියන්න.

i ශ්‍රම විභජනය හා විශේෂිකරණය

ii උද්ධමනය හා අවධමනය

iii පූර්ණ සේවා නියුක්තිය

iv ස්ථාවර ආවස්ථික පිරිවැය

(ලකුණු 05 x 04 = 20)

*************